# පැරණි හා නූතන සමාජ ක්‍රියාකාරිත්වයෙහිලා කවියෙහි සන්නිවේදන ශක්‍යතා පිළිබඳ අධ්‍යයනයක්

(කෝට්ටේ සහ කොළඹ යුගය ඇසුරෙනි)

FACULTY OF GRADUATE STUDIES
RECEIVED
06 JAN 2014
UNIVERSITY OF KELANIYA

FGS/ M/ MSSc 2003/32

H. M. P. K. හේරත් මැණිකේ

| | |
|---|---|
| ප්‍රවේශ අංකය: | 860 |
| වර්ග අංකය: | |

කැලණිය විශ්වවිද්‍යාලයේ, සමාජයීය විද්‍යා පීඨයේ,
ජනසන්නිවේදනය පිළිබඳ සමාජීය විද්‍යාපති උපාධිය සඳහා
ඉදිරිපත් කරනු ලබන ශාස්ත්‍රීය නිබන්ධනය.

2010

# සාරාංශය


පැරණි හා නූතන සමාජ ක්‍රියාකාරිත්වයෙහිලා කවියෙහි සන්නිවේදන ශක්‍යතා පිළිබඳ මෙම අධ්‍යයනය කෝට්ටේ සහ කොළඹ සාහිත්‍ය යුග ඇසුරින් එම යුගවල සමාජ, දේශපාලන, ආර්ථික පසුබිමක අනුගතව සිදු කරනු ලැබුවකි. අධ්‍යයනය සිදු කරන්නේ ලිඛිත කාව්‍ය උපයෝගී කර ගනිමිනි. භාෂිත කවි (හිටිවන කවි) යොදා ගෙන ඇත්තේ ද ඒවා වාර්තා වී ඇති ලේඛන ඇසුරු කර ගනිමිනි.

අනුරාධපුර යුගයේ සිට ම අවිච්ඡින්නව පවතින කවිය මෙම යුග දෙකෙහි සමාජ අවශ්‍යතාවට යෝග්‍ය වන පරිදි කවියේ අන්තර්ගතය, භාෂා භාවිතය, විරිත්, වෙනස් වී ඇති ආකාරය අවධානයට හසු කර ඇත්තේ භාවිත සන්නිවේදන ශක්‍යතා විමසුමෙනි.

පැරණි කවිය සිදු කරන සමාජ බලපෑම් සිදු කිරීමට අද්‍යතන කවියට හැකියාවක් නැත යන්න පර්යේෂණ ගැටලුව විය. එවැනි ගැටලුවක් හඳුනා ගැනීමට සිදුවන්නේ අද්‍යතන සමාජයේ කවිය කෙරෙහි ප්‍රමුඛතාව නොදක්වීම හා පුළුල් ජනමාධ්‍ය භාවිතය මගින් මෙම සන්නිවේදන මාධ්‍යයට ප්‍රමාණවත් අවශ්‍යතා ලබා නොදීම නිසා කවියෙහි සමාජ භාවිතය අවම වීමයි. පැරණි කවියේ මෙන්ම නූතන කවියෙහිද සමාජ බලපෑම් ශක්‍යතාවන් පවතී යන උපන්‍යාසය මත පර්යේෂණය සිදුකර තිබේ.

ලිඛිත සාහිත්‍ය පරිශීලනය ප්‍රධාන පර්යේෂණ ක්‍රමවේදය වන අතර අන්තර්ගත විශ්ලේෂණය හා සම්මුඛ සාකච්ඡා භාවිත කරන ලද වෙනත් පර්යේෂණ ක්‍රම වීය. තුලනාත්මක අධ්‍යයනය භාවිත කරනු ලැබූ තවත් පර්යේෂණ ක්‍රමයකි.

කවියෙහි භාෂාත්මක පදනම, විවිධ සන්නිවේදන අවස්ථා යොදා ගන්නා ආකාරය, සන්නිවේදන අරමුණ හා කවියේ සබඳතාව, දේශීය භාෂාවේ වර්ධනය හා කාව්‍ය භාෂා බලපෑම, පිළිබඳව මෙම පර්යේෂණයේදී අවධානය යොමු කර තිබේ.

කෝට්ටේ සහ කොළඹ කවි නිර්මාණය වූ සමාජ පසුබිම විමර්ශනයට හසුකර ඇති අතර එම සමාජ පසුබිමෙහි කවිය විද්‍යමාන කරන සන්නිවේදන ශක්‍යතාව කෙරෙහි අවධානය යොමු කොට තිබේ. ඒකාධිපති, යටත්විජිත, ප්‍රජාතන්ත්‍රවාදී සමාජ පරිණාමයක මුහුණ දෙන කෝට්ටේ සිට කොළඹ යුගය දක්වා අවධියෙහි සමාජ පරිවර්තනය කෙරෙහි කවියේ ශක්‍යතා අධ්‍යයනය සාකච්ඡා කර තිබේ. කොළඹ කවියට පසුබිම් වූ මහනුවර හා සීතාවක යුගවල කාව්‍ය භාවිතය අවධානයට යොමු කර ඇත.

නිගමන අටක් හා යෝජනා හයක් ඉදිරිපත් කර තිබේ. ආශ්‍රිත ග්‍රන්ථ හා සූචියට අමතරව ශ්‍රී ලංකාවේ දැනට පවතින කවි සමාජ ලේඛනයක් හා ඔවුන් විසින් ලබා දෙන සම්මාන ලේඛනයක්ද නිබන්ධයට ඇතුළු කොට තිබේ.